(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 19.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2025 පෙබරවාරි 14 සිකුරාදා පූ.භා. 9.30 ට**

## ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේ දී

**යෝජනා පිළිබඳ දැනුම්දීම**

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 1),— 2024 දෙසැම්බර් 03 සහ 2025 ජනවාරි 24 දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111, 2025 පෙබරවාරි 28 දක්වා අත්හිටවනු ලැබිය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 2),— 2024 දෙසැම්බර් 03 සහ 2025 ජනවාරි 24 දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 50(2) හි විධිවිධානවල සඳහන් "ආංශික අධීක්ෂණ කාරක සභාවට" යන වචන වෙනුවට "අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට" යන වචන ආදේශ කිරීමෙන් එකී ස්ථාවර නියෝගය 2025 පෙබරවාරි 28 දින දක්වා බලාත්මක විය යුත්තේ ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ වැඩකටයුතු (අංක 3),— 2024 දෙසැම්බර් 03 සහ 2025 ජනවාරි 24 දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවල කුමක් සඳහන්ව තිබුණ ද, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවලට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 152 ව්‍යවස්ථාවේ දක්වා ඇති පනත් කෙටුම්පත් හැර කාරක සභාවට යොමු කරනු ලබන වෙනත් යම් පනත් කෙටුම්පතක්, ගිවිසුමක්, කාරක සභාවේ විෂය පථයට යටත් වන ආයතනවල වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා ඇතුළත්ව පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද වාර්තාවක් හෝ කාරණාවක් හෝ යම් කාරක සභාවක් හෝ අමාත්‍යවරයෙකු හෝ විසින් එහි අධිකාර බල සීමාව තුළ ඇති විෂයයන් සහ කාර්යයන්ට අදාළ වෙනත් යම් කාරණයක් 2025 පෙබරවාරි 28 දක්වා විභාග කිරීමටත්, ඒවා සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කිරීමටත්, බලය තිබිය යුත්තේ ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— අද දින විසිර යෑමේ දී මෙම පාර්ලිමේන්තුව 2025 පෙබරවාරි 17 සඳුදා පූ.භා. 10.30 වන තෙක් කල් තැබිය යුතු ය.

5.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— වරප්‍රසාද,— පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 ජනවාරි 23 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය.

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු

*1.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***